# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2008 අංක 8 දරන මුදල් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2008 පෙබරවාරි මස 29 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 4.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි**

## 2008 අංක 8 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]

එල්. ඩී.— ඕ. 67/2007.

### 2005 අංක 5 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2008 අංක 8 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 2005 අංක 5 දරන මුදල් පනතේ I වන කොටසේ (සමාජ වගකීම් බද්ද පැනවීම) 2 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 2005 අංක 5 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) සියයට 1 අනුප්‍රමාණයකට 2006 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2007 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා ද;

(ඇ) සියයට 1.5 අනුප්‍රමාණයකට 2008 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන කාල සීමාවේ සිට සහ ඉන්පසු"; සහ

(2) එම වගන්තියේ දෙවන අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :—

"එසේම තවදුරටත් ආදායම් බද්ද මත අයවිය යුතු සමාජ වගකීම් බද්ද —

(අ) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ, මේ පනතේ මේ කොටසේ නියමයන් ප්‍රකාර, 2006 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භ වී 2006 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා සියයට 0.25ක අනුප්‍රමාණයකට ගණනය කොට අයකළ යුතු ය;

(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ, මේ පනතේ මේ කොටසේ නියමයන් ප්‍රකාර—

(i) 2006 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වී 2008 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා සියයට 1.0ක අනුප්‍රමාණයකට ; සහ

(ii) 2008 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන ඕනෑම කාලසීමාවක් සඳහා සියයට 1.5ක අනුප්‍රමාණයකට,

ගණනය කොට අය කළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 6අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

“මේ කොටස සඳහා අර්ථ නිරූපණය.

6අ. මෙම කොටසේ කාර්ය සඳහා —

“සමාගම” යන්නට, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ ඒ වචනයට දී ඇති අර්ථය ම තිබිය යුතුය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනයේ 5 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතම එකතු කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“5. ( XVI, XVII සහ XXI පරිච්ඡේදවල සහ 36 වන හා 65 වන වගන්තිවල විධිවිධාන හැර) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත, ඒ පනත 2006 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භව 2008 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන කාල සීමාව සඳහා ආදාළ වනතාක් දුරට ;

6. ( XVI වන, XVII වන සහ XXI වන පරිච්ඡේදවල සහ 36 වන වගන්තියේ සිට 65 වන වගන්ති දක්වා වගන්තිවල විධිවිධාන හැර) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත,

ඒ පනත යම් සමාගමකට සහ 2008 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන කාල සීමාවට ආදාළ වනතාක් දුරට.”.

**5.** (අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියට, මේ පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 2008 ජනවාරි මස 1 වන දිනයේ දී ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය ;

අතීතයට බලපෑම.

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියට, මේ පනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය මගින් කරන ලද සංශෝධනය සහ පළමුවන උපලේඛනයට මේ පනතේ 4 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනය 2008 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.